බැංකු පනත් විධාන 2018 අංක 05 2018 අගෝස්තු 23

## මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ විධානයන් සඳහා සංශෝධනය

2018 අංක 3 දරණ මෝටර් රථ සම්බන්ධව ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ බැංකු පනත් විධානය පහත පරිදි සංශෝධනය කර ආදේශනය කරන ලදී.

3. වට්ටනාකම මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම්

3.1 ඉහත සඳහන් බැංකු පනත් විධානයෙහි විධාන 2 හි සඳහන් සීමා පහත දක්වා ඇති ණය පහසුකම් සඳහා අදාළ නොවේ.

(i) සංචාරක සහ/හෝ ප්‍රවාහන කටයුතුවල නිරත ඕනෑම සමාගමකට සිය මූලික ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට මිලදී ගන්නා මෝටර් රථ සමූහ මිලදී ගැනීමට ප්‍රදානය කරනු ලබන ණය පහසුකම්, එසේ මූල්‍යනය කරන ලද මෝටර් රථ ඒවායේ පළමු ලියාපදිංචි දින සිට වසරක් යනතුරු වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට පවරා නොදීමේ පදනම මත.

(ii) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සඳහන් කර ඇති මූල්‍ය කල්බදු ක්‍රමයක් යටතේ රජයේ ආයතන සඳහා මිලදී ගන්නා මෝටර් රථ

(iii) රාජ්‍ය සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන් හා දුෂ්කර සේවයේ නියුතු ගුරුවරුන් සඳහා රජය විසින් සපයනු ලබන යෝජිත සහනදායී කල්බදු පහසුකම් යටතේ ලබා දෙන ණය පහසුකම්

3.2 මෙම ණය පහසුකම් ලබා දීමේදී බලපත්‍රලාභී බැංකු විසින් අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**